## 332 කිතුනි ඔබේ

කිතුනි ඔබේ අත් බව මා පිරිසිදු කරවා
ඔබේ සිරුර කිතුණේ මා ගලව ගනීවා
ඔබගේ ලේ කිතුණේ මා කුල්මත් කරවා
ඔබේ ඇලෙන් ගැලුව දියේ මා සෝදන්වා

ඔබ විඳැපූ වද තිස් දෙක මගෙ දිරි වඩවා
ගුණ කඳ වන ජේසුනි ඔබ මට කන් දෙන්වා
ඔබගේ වණ කැලැල් හි මා සඟව ගනිත්වා
ඔබෙන් වෙන්වැ ඉන්නට මට ඉඩ නොලැබේවා

හතුරු විපත් ලංවන ඔබ මා අරකින්වා
මගේ මරණ මොහොතේදි මා කැඳැව ගනිත්වා
ඔබ වෙතැ පැමිණෙන්නට මට අනේ ජේසුනේ
අවසර ඔබෙ ලැබෙන ලෙසට නියම කරන්වා

සඟවැසි ඔබෙ සුද්දවතුන් සමඟ එකතු වී
නොරක් නැතිවැ සතත කාලෙ ඔබට පසස ගී
ගයා ගයා ගෙවනට මට අවසර ලැබෙවා
එසේ මැ වේවා ජේසුනී එසේ මැ වේවා